# දකුණු පළාත් සභාව - ශ්‍රී ලංකාව

**කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසැපයුම් හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - දකුණු පළාත**

## ලංසු සඳහා ආරාධනයයි

# ජාතික තරගකාරී ලංසුකරණය

# පරිගණක, පරිගණක උපාංග හා තාක්ෂණ උපකරණ සැපයීම හා ස්ථාපනය කිරීම

## කොන්ත්‍රාත් අංක : MOA(ගි/2/5/4/2)2023/NCB/01

1. ශ්‍රී ලංකාවේ දකුණු පළාත් සභාව වෙත, CDF වෙතින්, දකුණු පළාත් සමූපාකර සංවර්ධන දෙපාර්තමේන්තු පිරිවැය සඳහා ප්‍රදානයක් ලැබී ඇති අතර, ඉන් කොටසක්, පහත වගුවේ විස්තර කොන්ත්‍රාත්තුව යටතේ වන සුදුසුකම්ලත් ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.

2. දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දකුණු පළාතේ කෘෂිකර්ම, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, පහත වගුවේ විස්තර සඳහන් කොන්ත්‍රාත්තුව සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අයිතම අංකය | භාණ්ඩයේ නාමය | ප්‍රමාණය (ගණන) | ලංසු ඇපකරය ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|
| 1 | ඩෙස්ක්ටොප් පරිගණක | 30 | 142,000.00 (දින 91 කට වලංගු) |
| 2 | යූපීඑස් යන්ත්‍ර | 30 | |
| 3 | පාස්පොත් ප්‍රින්ටර් යන්ත්‍ර | 16 | |
| 4 | ඩොට් මැට්‍රික්ස් ප්‍රින්ටර් යන්ත්‍ර | 12 | |
| 5 | ලේසර් ප්‍රින්ටර් යන්ත්‍ර | 14 | |
| 6 | මුදල් ගණිත යන්ත්‍ර | 04 | |
| 7 | මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍ර | 03 | |
| 8 | ප්‍රොජෙක්ටර් තිර | 03 | |
| 9 | ඡායා පිටපත් යන්ත්‍ර | 01 | |

3. රජයේ ප්‍රසම්පාදන "මාර්ගෝපදේශ" වල නිර්දිෂ්ඨ පරිදි ජාතික තරගකාරී ලංසුකරණ (NCB) ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලබන අතර, ශ්‍රී ලංකාවේ සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්හට විවෘතය.

4. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 5,000/= ගෙවීමෙන් හා ගාල්ල, ලබුදූව, දක්ෂිණපායේ, 4 වන මහලේ දකුණු පළාත්, සමුපකාර සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් වෙත ව්‍යාපාර ලිපි ශීර්ෂයක් මත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල, 2023.11.03 දින සිට 2023.11.22 දින දක්වා පෙ.ව. 9.30 හා ප.ව. 3.00 අතර, කාලය තුළ ලංසුලේඛන ලබාගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතු වේ. සම්පූර්ණ කළ ලංසු, ලියාපදිංචි තැපැලෙන් සීඝ්‍රදූත සේවය මගින් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතුය. කෙසේ වෙතත්, තැපැලේදී සිදුවිය හැකි අස්ථානගත වීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ වගකීමක් නැත.

5. අදාළ ලංසු ලේඛන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේදී රාජකාරී දිනවල **පෙ.ව. 9.30 හා ප.ව. 3.30** අතර කාලය තුළ නොමිලයේ පරික්ෂා කොට බැලිය හැක.

6. මේ සම්බන්ධ පෙර ලංසු හමුවක් පහත ලිපිනයේ කාර්යාලයේදී **2023.11.14 දින පෙ.ව 9.00 ට** පැවැත්වීමට නියමිතය.

7. ලංසු, අදාළ ලංසු විවෘත කරන දිනයේ සිට දින 77 දක්වා වලංගු විය යුතු අතර, ඉහත 2 ඡේදයෙහි සඳහන් පරිදි වූ වටිනාකමට වෙන් වශයෙන් වූ ලංසු ඇපකර ලංසු සමග තිබිය යුතුය. එය, බැංකු ඇපකරයක් වශයෙන් වූ ආකෘතියෙන් යුක්තව ලංසු ලේඛනයන්හි සඳහන් උපදෙස් ප්‍රකාරව ගත් එකක් විය යුතුය.

8. ලංසු, පහතින් දක්වා ඇති ලිපිනය වෙත 2023.11.03 දින සිට 2023.11.23 දින දක්වා පෙ.ව. 11.00 තෙක් ලැබීමට සැලැස්විය යුතුය.

9. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම්, කෘෂිකර්ම, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - දකුණු පළාත,**
**4 වන මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.**
**දුරකථනය - 091-4943088, 091-2234604 ෆැක්ස් - 0912247835**